# පටිච්චසමුප්පාදයේ අරමුණුවල විවිධත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

- හඳගිරියේ සිරිසුමන හිමි

නිර්මාණවාදී දේව සංකල්පයන්ගෙන් ඇලලී ගත් අනේකවිධ වූ පුද පූජා යාතුකර්ම හා ශාන්ති කර්ම ආදියෙන් ගැවස ගත් ආගමික වටපිටාවක් ක්‍රි.පූ. 6 වන ශතවර්ෂයවන විට භාරතීය සමාජයෙහි දක්නට ලැබුණි. විශේෂ වශයෙන් ඍග් වේදයේ සිට අතරතුර පහළ වූ සිව්වෙනි අථර්වන් වේදය දක්වා වෛදික ඉගැන්වීම් කර්ම මාර්ගය තුළ මිනිසා සිරගත කොට තිබුණු අතර උපනිෂද්වල සිට ජෛන ශාක්‍ය යෝග ඉගැන්වීම් හරහා ඥාන මාර්ගයකට යොමු වීමෙන් 'තමා නිර්මාණය කොට ඇත්තේ නොදන්නා නොපෙනෙන දෙවියකු විසින් නොව ස්වාභාවික සංසිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් මෙලොව බිහිවී ඇත' යන සිතිවිල්ල දක්වා මිනිසා සංවර්ධනය වී තිබුණි. මෙකී සංවර්ධනයේ අග්‍රඵලය බුද්ධිමය වශයෙන් ලොව කිසිවෙකුට ද්විතීක නොවන විශිෂ්ට බුද්ධිමහිමයකින් හෙබි බුදුන් වහන්සේ විසින් හේතුඵල න්‍යාය ධර්මය ඉදිරිපත් කරනු ලැබීමයි.

අනේකවිධ ඉගැන්වීම්වලින් මංමුලාවී සිටියවුන්හට සැබෑ මාර්ගෝපදේශයක් ලබාදීම සඳහා මෙම ඉගැන්වීම බුදුන් වහන්සේ විසින් දේශිත ය. බුද්ධකාලීන භාරතයේ ජනප්‍රියව පැවති ජෛන සාසනය සහ වෙනත් ආචාර්යවරුන්ගේ ඉගැන්වීම් තුළින් සාමූහික ගුරුකුල සම්ප්‍රදායන් ප්‍රතිෂ්ඨාපනය වෙමින් තිබුණි. මෙකී සමූහ ගුරුකුල සම්ප්‍රදායෙන් ජීවන රටාව පවත්වාගෙන ගිය ගුරු ශිෂ්‍ය උභය පාර්ශ්වය සිය ජීවන පැවැත්ම අන්‍යයන් විසින් ප්‍රදානය කරන ලද දාන වස්තුන්ගෙන්



යැපෙමින් ගෙන යන ලදි. පරපටි බද්ධ වූ මෙම සකලවිධ ප්‍රව්‍රජිතයෝ ආරාමික ජීවිතයක් ගත කළහ. ඒ වන විට අලුතෙන් ම ප්‍රසිද්ධියට පත් වෙමින් සිටි සිද්ධාර්ථ ගෞතම බුදුන් වහන්සේ තවුස් ජනයාගේ මෙන්ම ගෘහස්ථ හුදී ජනයින්ගේ අවධානයට යොමු වූයේ උන්වහන්සේ නවතම දහමක් දේශනා කරන ලද හෙයිනි. ක්‍රි.පූ. 6 වන ශතවර්ෂයේ භාරතයට නව්‍ය වූ මෙම ඉගැන්වීම හේතුඵල ධර්මතා න්‍යාය පදනම් වූවකි. මෙය නිර්මාණවාදී විශ්වාසවලට බලවත් තර්ජනයක් විය. බුදුන් වහන්සේ චාරිකාවේ හැසිරෙමින් සිය ශිෂ්‍ය ප්‍රජාවද චාරිකාවට යොමු කරමින් උගන්වා වදාළේ කිසියම් හේතුවක් නිසා ඵලයක් හටගන්නා බවයි. කර්ම මාර්ගයෙහි නිමග්න වූ ආචාර්යවරු යම් යම් කර්මවලට නිශ්චිත වශයෙන් ම ලැබෙන්නා වූ විපාක පිළිබඳව කරුණු ඉදිරිපත් කළහ. එය තරමක් වෙහෙසකර වූ කර්මවාදයක් වූ හෙයින් බුදුන් වහන්සේ එය අවබෝධ කරගැනීමේ පහසුව සඳහා කර්මය සහ ඵලය අතර සම්බන්ධතාව ගෙනහැර දැක්වෙන නව කර්මවාදයක් උගන්වන ලදි. බුදුන් වහන්සේගේ කර්මවාදය ආචාරධර්මීය ඉගැන්වීමක් වන අතර ආචාර ධර්මයට පටහැනි චර්යා රටාවන්හි නිරතවන්නන්ට ඊට අනුරූපව විපාක වශයෙන් ලැබෙන ප්‍රතිඵලයන් ද යහපත් කර්මයන්හි නිරතවීම නිසා ලැබෙන යහපත් වූ ප්‍රතිඵල ද වෙන් වශයෙන් උගන්වනු ලැබේ. මෙම කර්ම ඥානය මිනිසා සදාචාරවත් මෙන් ම පාරලෞකික සුබය කෙරෙහි අවධිමත් වූ අවධානයකින් යුක්ත පුද්ගලයකු බවට පත් කරයි. ඊට හේතුව යහ කර්මයට ඵල වශයෙන් යහපත් ඵලයකුත් අයහපත් කර්මයට ඵල වශයෙන් අයහපත් ඵලයකුත් හඳුනාගත හැකිවීමයි. මනුෂ්‍යයා තුළ පවත්නා ලෞකික අවශ්‍යතාවන් සහ ඒවා ඉටුකර ගැනීම සඳහා කරනු ලබන ක්‍රියාකාරකම් හේතුඵල ධර්ම න්‍යාය ඔස්සේ සලකා බැලීමේ දී පෘථග්ජන මිනිසුන් විසින් කරනු ලබන්නා වූ වෙනත් ක්‍රියාකාරකම් නිෂ්ප්‍රයෝජන ක්‍රියා වශයෙන් ප්‍රතික්ෂේප වේ. එබඳු නිෂ්ප්‍රයෝජන ක්‍රියාවන්හි යෙදෙන මිනිසුන් සාරධර්ම වශයෙන් ඵලදායී ක්‍රියාදාමයක යොදවා ගැනීම සඳහා උපයෝගී කරගත හැකි මිනිස් චර්යා රටාවන් පමණක් නොව ස්වාභාවික සංසිද්ධීන්ගේ පවා ප්‍රත්‍ය වශයෙන් යෙදෙන හේතුඵල

න්‍යාය ධර්මය වෙනත් කිසිදු දහමක නොදැක්වෙන තරමටම දුර්ලභ ඉගැන්වීමකි. මෙහි දුර්ලභ ක්‍රම හා සමගාමීව පුළුල් ක්ෂේත්‍රයකම පැතිර සිටීම පුනරුක්තයක් වුවත් නැවත නැවත ද අවධාරණය කළ යුතුව ඇත.

පටිච්චසමුප්පාද න්‍යාය දර්ශනය දේශනා කිරීමේ පදනම සත්ත්වයාගේ සසර පිළිබඳ යථා තත්ත්වය හා සමාජගත ගැටලුවල යථා තත්ත්වයෙන් විග්‍රහ කිරීමත්, එම ගැටලු විසඳා ගැනීමෙහි හැකියාව මනුෂ්‍ය ප්‍රජාවට ලබාදීමත් ය. එහි ආවසානික ප්‍රතිඵලය ලෝකයෙහි යථා ස්වභාවය අවබෝධ කරගැනීමයි. ප්‍රතීත්‍යසමුත්පාද දර්ශනය හුදු විද්‍යාත්මක දේශනාවක් නොවන අතර එමගින් අපේක්ෂිත මූලික අරමුණු දෙකක් පැහැදිලිව හඳුනා ගත හැකි ය. එනම්,

- පුද්ගල සන්තානගත දුක්ඛ ප්‍රභවය හා ප්‍රහාණය වන අකාරය විවරණය කිරීම
- සමාජගත දුක්ඛ ප්‍රභවය හා ප්‍රහාණය වන අකාරය විවරණය කිරීම

වශයෙනි. පටිච්චසමුප්පන්න දේශනය පුද්ගලානුබද්ධ දුක හා සමාජගත දුක නිරාකරණය කර ගැනීම සඳහා ඉවහල් වන අතර කෙලෙස්වලින් තොර නිර්වාණාවබෝධය සඳහා උපකාරී වන ප්‍රමුඛ දේශනයකි. පටිච්චසමුප්පාදයෙහි මුල් කෙටි සූත්‍රය සමුදය හා නිරෝධය පිළිබඳ පූර්ණාවබෝධය පිණිස මනා පිටිවහලක් වේ.

''ඉමස්මිං සති ඉදං හොති - ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති
ඉමස්මිං අසති ඉදං න හොති -ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති''[1]
(මෙය ඇති විට මෙය වෙයි. - මෙය ඉපදීම නිසා මෙය උපදී.



මෙය නැති කල්හි මෙය නොවෙයි. - මෙහි නිරෝධය නිසා මෙය නිරෝධ වේ.)

පටිච්චසමුප්පාදයේ හරය හා පිණ්ඩාර්ථය මෙනයින් පෙනේ. මුල් කරුණු ද්වයෙන් දුක්ඛ ප්‍රභවයත්, තෙවන හා සිව්වෙනි කරුණුවලින් දුක්ඛ නිරෝධයත් දැක්වේ. මෙකී න්‍යායට අනුව ලොව පවත්නා සියලු දෙයක් ම හේතුඵල සම්බන්ධයෙන් යුක්තව පවත්නා බවත්, එය සාපේක්ෂකව අන්‍යෝන්‍ය ලෙසින් සම්බන්ධ වන බවත් දක්වා ඇත. සියලු නාමරූප ධර්මයෝ සාපේක්ෂිතයෝ ය. සාපේක්ෂව හට නොගත් ස්වාධීනව හටගත් කිසිදු ධර්මයක් ලොව නැත. හේතුවට සාපේක්ෂව හටගත් දෙය එකී හේතුව නැසී යාමෙන් විනාශයට පත්වෙයි. (හේතුං පටිච්චසම්භූතං හේතු භංගා නිරුජ්ඣති)[2] මෙකී කෙටි සූත්‍රයානුසාර පටිච්චසමුප්පාද න්‍යාය විවිධ අරමුණු විෂයෙහි උපයුක්ත වූ බව ත්‍රිපිටකාගත සූත්‍රානුසාරයෙන් හඳුනාගත හැක.

## 1. පටිච්චසමුප්පාදයේ මූලික අරමුණ

බුදුදහමේ මූලික ප්‍රතිෂ්ඨාව වන පටිච්චසමුප්පාදයේ මූලික අරමුණ සත්ත්වයාගේ දුක්ඛ සම්භවයත්, දුක්ඛ නිරෝධයත් දැක්වීමයි. පටිච්චසමුප්පාද කෙටි සූත්‍රය සංශ්ලේෂණාත්මක විවරණය ලෙස හැඳින් විය හැක. ද්වාදශාංග ප්‍රත්‍ය විමර්ශනය ජනප්‍රිය පටිච්චසමුප්පාදය බවත් නියම පටිච්චසමුප්පාදය මෙම කෙටි සූත්‍රයෙන් කෙරෙන පටිච්චසමුප්පාද විවරණ බවත් උගතුන්ගේ මතයයි.[3] එසේම නියම පටිච්චසමුප්පාදය හඳුන්වනු ලබන්නේ 'පටිච්චසමුප්පාදනය' ලෙසිනි. කෙසේ නමුත් මෙකී කෙටි සූත්‍රයෙහි යෙදෙන 'මෙය' යන්නට 'හේතුව' හා 'ඵලය' වශයෙන් විමසීමේදි පහත ආකාරයෙන් හඳුනාගත හැක.

හේතුව ඇති විට ඵලය වෙයි - හේතුව ඇති විමෙන් ඵලය ඇති වේ.
හේතුව නැති විට ඵලය නැත - හේතුව නැති වීමෙන් ඵලය නැති වේ.

මෙහි හේතුව සමග ඵලය සතරාකාරයට යෙදී ඇත.

- හේතුව හා ඵලය එකට පැවතිම
- හේතුව සමග ඵලය ඇති වීම
- හේතුව නැති විට ඵලය නැති වීම
- හේතුව නැතිවන විට ඵලය නැති වීම[4]

සංඛත ධර්මයන්ගේ ස්වභාය හේතු ඵල එක්ව ඇති වී, පැවතී, නැතිවීමයි. පටිච්චසමුප්පාදය තුළින් සංඛත ධර්මවල වර්තමාන තත්වය විශ්ලේෂණය කෙරේ. මෙහි හේතුව හා ඵලය හැඳින්වීම සඳහා ත්‍රිපිටකයේ යොදාගෙන ඇති පද රැසකි. පච්චය, හේතු, කාරණ, නිදාන, සම්භව, ප්‍රභව හා උපනිසා යන වචන වේ.[5] හේතු ඵල අතර ඇත්තේ සාපේක්ෂක සම්බන්ධයකි. සංයුත්තනිකායේ නළකපාල සූත්‍රයෙහි බට ලී උපමාවකින් මෙය මැනවින් විග්‍රහ කරයි. බට ලී මිටි දෙකක් කෙලින් සිටුවා තැබිය හැක්කේ එකක අනෙකට හේත්තුකර තැබීමෙනි. එක් බට ලී මිටියක් වැටුනොත් අනෙකද වැටේ. නාමරූප හා විඤ්ඤාණ අතර සම්බන්ධය ද මෙසේ ය.[6] බීජයක් පැලවීමට නම් පොළව, ජලය, බීජය ආදී ප්‍රත්‍ය සමූහය අවශ්‍ය වන්නා සේම මිනිසාද ප්‍රත්‍ය සහිත විඤ්ඤාණය නන්දිරාගයෙන් යුක්ත වුවහොත් සසර ගමන සකස් වන බවත්, එසේම විඥානස්ථිති ප්‍රහීණ වීමෙන් පුනර්භවය නැතිවී විමුක්තිය ලැබෙන බවත්, බීජ සූත්‍රය දක්වයි.[7] චතුරාර්ය සත්‍යය හා සියලු බුද්ධ දේශනය මෙම පටිච්චසමුප්පාදය පදනම් කොට ගත්තකි. චතුරාර්ය සත්‍යයෙහි දුක්ඛ සමුදය හා දුක්ඛ නිරෝධ සත්‍ය විවරණය කරනුයේ ද මෙම න්‍යාය ඔස්සේ වන අතර එය පටිච්චසමුප්පාදයේ මූලික අරමුණයි. එනම්, මෙම මූලධර්මයේ මූලික අරමුණ පුද්ගල සංතානයේ දුක ඇතිවන හා නැතිවන ආකාරය බවයි. සංයුත්තනිකායේ අනුරාධ සූත්‍රයෙහිදී බුදුන්වහන්සේ දේශනා කරනුයේ දුක ද දුක නැති කිරීම ද යන්න පමණක් බව දක්වයි.



(පුබ්බේචාහං අනුරාධ ඒතරහිච දුක්ඛඤ්චේව පඤ්ඤපෙමි දුක්ඛස්ස ච නිරොධං)[8] එහෙත් දුක හා දුක නැති කිරීමේ මාර්ගය පිළිබඳව ද ධර්මයෙහි විග්‍රහ වේ. සියලු සංස්කාර ධර්මයන්ගේ යථා ස්වභාවය විවරණය කෙරෙන මෙම න්‍යාය ප්‍රවෘත්තිය අනුසෝතගාමී හා නිවෘත්තිය පටිසෝතගාමීව දක්වා ඇත. පුද්ගල සන්තානගත දුක්ඛ ප්‍රභවයට ප්‍රස්තුතවන සාධක ද්වාදශාංග ප්‍රත්‍ය මගින් විග්‍රහ වේ. එකී පටිච්චසමුප්පන්න වූ ක්‍රියාසන්තතිය සංසාර ගත දුක ඇති වන අයුරු විග්‍රහ කරයි. එය මිනිසා අභියස වූ මූලිකම ගැටලුවයි. එය විසඳීම පටිච්චසමුප්පාදයේ මූලික අරමුණය.

සියලු නාමරූප ධර්මයෝ සංස්කෘතයෝය. උපදින සෑම සංස්කෘත ධර්මයකටම අනන්‍ය ස්වභාවය නිරුද්ධ වීමයි. 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බංතං නිරෝධ ධම්මං" නිබඳව වෙනස් වීම ස්වභාව කොට ඇති භවයද අනිත්‍ය, සංස්කෘතය, ප්‍රතීත්‍ය සමුත්පන්නය, උපදින සුලුය. යළිත් නැසෙන සුලුය. (භවෝ භික්ඛවේ අනිච්චෝ, සංඛතෝ, පටිච්චසමුප්පන්නෝ, ඛයධම්මෝ, වයධම්මෝ, විරාගධම්මෝ, නිරෝධධම්මෝ)[9]

දුක්ඛ ආර්ය සත්‍ය හෙවත් දුක යන්නට කෙරෙන විවරණයක් සංයුත්ත නිකායේ අචේලකස්සසප සූත්‍රයෙහි වේ.[10] එසේ ම දුක්ඛ සමුදය හා දුක්ඛ නිරෝධය පටිච්චසමුප්පාදයේ ද්වාදශාංග ප්‍රත්‍යය මගින් කෙරෙන විග්‍රහයක් සංයුත්ත නිකායේ විභංග සූත්‍රයෙහි දැකිය හැකි ය.[11] එකී ප්‍රත්‍යය සමූහය දුක්ඛ සම්භවය අවිද්‍යාවෙන් බව දැක්වුව ද එය චක්‍රාකාර වූ ක්‍රියාවලියකි. එනයින් එය භව චක්‍රය නමින් ද හැඳින් වේ. ද්වාදශාංගයන්ගෙන් ඕනෑම අංගයක් හෝ හේතුප්‍රත්‍ය වී ආරම්භ විය හැකි ය. අවිද්‍යාව පළමු අංගය ලෙස හැඳින්වුව ද එය ජීවිතයේ ආරම්භය ලෙස සැලකිය යුතු නැත. ඒ වෙනුවට එය මිනිස් දිවියේ පුද්ගලයාට මුහුණ දීමට සිදුවන දුක් සමූහයාගේ මූල හේතුව සේ සැලකිය යුතු ය.[12] ලෝකයේ හෝ සත්වයාගේ පැවැත්මට හේතුවන එකම හෝ මූල හේතුවක් පටිච්චසුප්පාදයෙන් විවරණය නොවේ. සත්වයාගේ සසර ගමනට

බලපාන හේතු ප්‍රත්‍යය සමූහයක් ද්වාදශාංගයෙන් දැක්වේ. ආරම්මණයන් කෙරෙහි ඇලී මමත්වයෙන් කටයුතු කරන්නා භව ගමන සකසා ගනී. තණ්හාදාස වූ සත්වයා අතෘප්තියෙන් හා අසහනයෙන් මිය යන අතර දුකෙහිම ඇලී ගැලී භවගාමී වේ. එනම් උපාදානය නිසා භවත් (සංස්කාර) එයින් ජාතියත්, ජාතිය නිසා සාංසාරික දුක්ඛපුඤ්ජයාගේ හටගැනීමත් වේ. මෙම සාංසාරික භව ගමන නවතා සාංසාරික දුක්ඛ නිරෝධය සඳහා පටිච්චසමුප්පාදයේ න්‍යායවබෝධය ද වැදගත් ය. යම් ආර්ය ශ්‍රාවකයෙකු පටිච්චසමුප්පාදයත්, පටිච්චසමුප්පන්න ධර්මයන් ද තතුසේ සම්‍යක් ප්‍රඥාවෙන් මැනවින් අවබෝධ කිරීමෙන් තමා පිළිබඳ සියලු සැක පහව යන බව පච්චය සූත්‍රය දක්වයි.[13] එසේ මධුපිණ්ඩික සූත්‍රයට අනුව ඇසත්, රූපත් හේතු කොට ගෙන චක්ඛු විඤ්ඤාණය පහළ වී ප්‍රපංචකරණයට යටවීමෙන් පුද්ගලයා භවයට බැඳේ. මේ අනුව පුද්ගල සන්තානගත දුක්ඛ සම්භවයට ඉවහල් වන හේතුප්‍රත්‍යය හා එහි ඵලය වශයෙන් සසර භවාන්තරගතව දුක් සමූහයාට ගෝචරව සත්ත්වයාට විසීමට සිදුවන ආකාරය හඳුනාගත හැකි ය. එනම් පුද්ගලයා ඉන්ද්‍රියානුසාරයෙන් ලබන වින්දන විෂයෙහි තෘෂ්ණා- උපාදාන උපදවාගෙන සංස්කාර පිළිබඳ යථාවබෝධය නොමැතිව භව දුක විඳින බව ය. තෘෂ්ණාදී හේතු ප්‍රත්‍ය නිරෝධය මගින් සාංසාරික දුක්ඛ සමූහයාගේ දුක්ඛ නිරෝධය ලබා ගත හැක. එය පරම තත්වය වන නිවනයි.

දුක්ඛ නිස්සරණය සඳහා ඇවැසි යථාභූත ඥානය උපදවන ධර්ම න්‍යාය පටිච්ච සමුප්පාදයයි. එකී ඥානය පුද්ගලයාට දැනවීමේ අරමුණින් විවිධාකාරයෙන් මෙකී න්‍යාය සූත්‍ර පිටකයෙහි විග්‍රහ වේ. පටිච්චසමුප්පාදය වනාහි අන්තද්වයෙන් තොර වූ මධ්‍යම ප්‍රතිපදාවක් ලෙස කච්චායන හිමියන්ට බුදුන් වහන්සේ දේශනා කළහ.[14] සංයුත්ත නිකායේ සමණ බ්‍රාහ්මණ සූත්‍රයන්හි දේශිත පටිච්චසමුප්පාදයේ අරමුණ චතුරාර්ය සත්‍යය විවරණය කිරීමයි. එය පුද්ගල සංතානගත දුක් සමූහය පිළිබඳ කෙරෙන මනා විග්‍රහයකි.[15] එසේම ද්වාදශාංගය වෙනුවට අංග විසි දෙකක් යටතේ පුද්ගල සන්තානයේ දුක



ඇතිවන ආකාරය දැක්වෙන අපූර්ව විග්‍රහයක් උපනිසා සූත්‍රයෙහි ද වේ.[16] සත්ත්වයා හා ලෝකයේ යථා ස්වභාවයත් සසරින් මිදීම පිළිබඳවත් ගැඹුරින් දාර්ශනිකව සකාරණව විවිධාකාරයෙන් දේශිත සූත්‍රයකි, දීඝ නිකායේ මහානිදාන සූත්‍රය. එය ඕනෑම සත්ත්වයකු අනිවාර්යෙන් මුහුණ දිය යුතු ජරාමරණ දුක්ඛ පිළිබඳ ආනන්ද තෙරුන්ට දේශිත ධර්ම විග්‍රහයකි. සන්තානගත දුකත්, සමාජගත දුකත් සකාරණව ප්‍රභවය වන අයුරුත්, එම කාරණා ප්‍රහාණයෙන් විමුක්තිය ලැබෙන බවත් දීර්ඝ වශයෙන් විග්‍රහ කිරීම මෙහි දක්නට ලැබේ.

"කිමෙක ප්‍රත්‍යයෙන් ජරාමරණවේදැයි මෙසේ විචාරන්නේ නම්, ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වේ...... භව ප්‍රත්‍යයෙන් ජාතිය වේ....තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානය වේ."

වශයෙන් විග්‍රහයක යෙදෙන බුදුරජාණන් වහන්සේ ජාති දුක්ඛයට ජරාමරණය හේතුවන බව උදාහරණ සහිතව දක්වනුයේ පහත අයුරිනි.

"ආනන්දය, හැම අයුරින් ම හැම ලෙසින් ම ජාතිය කිසිවෙකුට කිසිඳු තැනක නොවේනම්, විභාග විසින් දෙවියන්ගේ දෙව් බව පිණිස හෝ ගඳෙව්වන්ගේ ගදෙව් බව පිණිස හෝ යකුන්ගේ යක් බව පිණිස හෝ උපන් කවර සතුන්ගේ ඒ ලත් අත්බව පිණිස හෝ මිනිසුන්ගේ මිනිසත් බව පිණිස හෝ සිව්පාවුන්ගේ සිව්පා බව පිණිස හෝ පක්ෂීන්ගේ පක්ෂි බව පිණිස හෝ සරීසෘපයන්ගේ (බඩගා යන සතුන්ගේ) සරීසෘප බව පිණිස හෝ ඒ ඒ සතුන්ගේ එසේවීම පිණිස ජාතිය නොවීනම්, සර්වප්‍රකාරයෙන් ම ජාතිය නැති කල්හි ජාතියගේ නිරෝධයෙන් (අභාවයෙන්) ජරාමරණය පැනෙන්නේ ද? වහන්ස, මෙය නොම වන්නේ යැයි ආනන්ද තෙරණුවෝ වදාළහ. එහෙයින් ආනන්දය, යම් යම් ජාතියෙක් වේ ද ජරාමරණයට මෙය ම හේතු ය. මෙය ම නිදාන ය. මෙය ම සමුදය ය. මෙය ම ප්‍රත්‍යය ය."[17]

මේ අනුව සත්ත්වයාගේ දුක්ඛ සම්භවය හා දුක්ඛ නිරෝධය විග්‍රහ කිරීම මහා නිදාන සූත්‍රයේ මූලික අරමුණ වී ඇති බව පෙනේ.

යථෝක්ත සූත්‍ර විවරණ අනුව භවගාමී සත්ත්වයාගේ දුක ඇතිවන ආකාරයත්, එහි නිරෝධයත් දැක්වීම පටිච්චසමුප්පාද න්‍යායෙහි මූලික අරමුණ වී ඇති බව පැහැදිලි ය. එහිදී දුක පිළිබඳ යථාර්ථය ඉදප්පච්චයතා පටිච්චසමුප්පාද කෙටි සූත්‍රයෙන් සංස්ලේෂණාත්මකවත්, ද්වාදශාංගික පටිච්චසමුප්පාදයෙන් විශ්ලේෂණාත්මකවත් විවරණය වේ. අනේක පරියාය වූ මෙම ධර්ම න්‍යාය විවිධ අතිරේක අරමුණු විෂයෙහි ද උපයුක්ත බව පෙනේ. එකී සූත්‍රදේශනා ද මූලික අරමුණු හා අත්‍යන්තයෙන් බැඳී පවතී.

## 2. පටිච්චසමුප්පාදයේ අතිරේක අරමුණු

බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ දුක ද, දුක නැති කිරීම ද, ගැන පමණක්ම බව උන්වහන්සේ වදාළහ.[18] 'පුබ්බේචාහං අනුරාධ එතරහිච දුක්ඛඤ්චේව පඤ්ඤපෙමි. දුක්ඛස්ස නිරොධං' දුක ඇතිවන ආකාරායත් දුක නැති කිරීමේ මාර්ගයත් දහමින් ඉදිරිපත් කළ යුතුව ඇත. එම කරුණු විග්‍රහ කරන දහම පටිච්චසසමුප්පාදයයි. පුද්ගල සන්තාන ගත දුක විවරණය කිරීම පටිච්චසසමුප්පාදයේ මූලික අරමුණ වන අතර බුද්ධ දේශිත සෑම ධර්මයක් කෙරෙහිම උපයුක්ත වන සාර්වභෞමික උත්කෘෂ්ට ධර්මයක් ලෙස පටිච්චසමුප්පාදය හැඳින්විය හැකි බව එහි සුඛනම්‍ය ස්වරූපය නිසා විවිධ ප්‍රයෝග සමග මිශ්‍ර කර ඇති ආකාරයෙන් හඳුනාගත හැක. සත්ත්වයාගේ ආවසානික ප්‍රතිඵලය වන්නේ නිවන සාක්ෂාත් කරගැනීමයි. ඒ දක්වා සසර සැරිසරන සත්ත්වයෝ විවිධ භවවල උපත ලබති. එහිදී සත්වයෝ නොයෙක් ගැහැටවලට මුහුණ දෙති. සමාජ ප්‍රස්තුත හෙවත් පුද්ගල සමාජ ගත දුක ඇතිවන නැතිවන ආකාරය අවබෝධ කරවීමටද මෙම න්‍යාය භාවිතව ඇත. සුත්ත



නිපාතයේ වාසෙට්ඨ සූත්‍රය දක්වනුයේ සමාජය සැකසී ඇත්තේ පටිච්චසමුප්පාද න්‍යායට අනුව බවයි.

"ඒවමෙතං යථාභූතං කම්මං පස්සන්ති පණ්ඩිතා
පටිච්ච සමුප්පාදසා කම්මවිපාක කොවිදා" (656 ගාථාව)

'ප්‍රතීත්‍ය සමුප්පාදය දක්නා වූ කර්ම විපාක දෙක්හි දක්ෂ වූ පණ්ඩිතයෝ මෙසෙයින් තෙල කර්මය යථාභූතයෙන් දක්නාහ.'[19] සමාජ සංදර්භයන්හි දී විවිධ මාන ඔස්සේ පටිච්චසමුප්පාද දර්ශනය භාවිත අයුරු පහත ආකාරයට විග්‍රහයට ලක් කෙරේ.

- දාර්ශනික ගැටලු විග්‍රහ කිරීම

පටිච්චසමුප්පාද න්‍යාය විවිධ දාර්ශනික ප්‍රස්තුත විෂයෙහි භාවිත කොට ඇත. මූලික බෞද්ධ දාර්ශනික සංකල්ප විග්‍රහයෙහි මෙන්ම අන්‍ය දෘෂ්ටි විග්‍රහ කිරීමෙහි ද මෙකී න්‍යාය භාවිත කොට ඇති බව සූත්‍ර දේශනාවන් තුළින් වඩාත් ප්‍රකටව පෙනේ. පටිච්චසමුප්පාදයේ දාර්ශනික වැදගත්කම විමසීමේදී බුද්ධකාලීන භාරතයෙහි පැවැති අන්තවාදී දෘෂ්ටිවලට නොවැටී මධ්‍යම දේශනාවක් අනුගමනය කිරීම වැදගත් වේ. පටිච්චසමුප්පාදය අන්තවාදී දෘෂ්ටි ප්‍රතික්ෂේප කරන මධ්‍යම ප්‍රතිපදාව වන බව මූලික සූත්‍රයන්හි විග්‍රහ වේ. සංයුත්තනිකායේ නිදාන වග්ගයේ එන ලෝකායතික සූත්‍රයෙහි පටිච්චසමුප්පාද දේශනාව මධ්‍යම දේශනාවක් බව මැනවින් විග්‍රහ කරයි.

"කින්නුඛො භො ගොතම සබ්බමත්ථීති? සබ්බමත්ථීති ඛො බ්‍රාහ්මණ ජෙට්ඨමේතං ලෝකායතං. කිං පන භො ගොතම, සබ්බං නත්ථීති? 'සබ්බං නත්ථීති'ති ඛො බ්‍රාහ්මණ දුතියමෙතං ලොකායතං. කින්නු ඛො භො ගොතම සබ්බමෙකත්තන්ති ඛො බ්‍රාහ්මණ තතියමෙතං ලොකායතං කිං පන භො ගොතම සබ්බං පුථුත්තන්ති? සබ්බං පුථුත්තන්ති ඛො බ්‍රාහ්මණ චතුත්ථමෙතං ලොකායතං. එතෙ තෙ බ්‍රාහ්මණ උභො අන්තෙ අනුපගම්ම

මජ්ඣෙන තථාගතො ධම්මං දේසෙති.... අවිජ්ජා පච්චයා සංඛාරා....''[20]

කිසියම් බ්‍රාහ්මණයෙකු බුදුරදුන් සමග කළ සාකච්ඡාවක් මෙහි සඳහන් වේ. අන්ත දෙකක් දක්වන මෙහි 'සබ්බං එකත්තං' සියල්ල එකත්වයෙන් හා 'සබ්බං පුථුත්තං' ලොව සියල්ල නානත්වයෙන්ද යුතු බව ඒ අන්ත දෙකයි. විවිධත්වයක් ඇති ලෝකය බ්‍රහ්මන් වැනි සංකල්පයක් යටතේ එකක් වශයෙන් ගැනීම මෙහි එකත්වයෙන් යුක්ත වන්නේයැයි අදහස් කෙරේ. ලෝකය කොටස් කොට ධාතු බාහුල්‍යයක් ලෙස ප්‍රකාශ කිරීම, තේරීම අනෙක් අන්තයයි. මෙම දර්ශන දෙකම තුන්වන හා සිව්වන ලෝකායත දර්ශන ලෙස සලකා බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. එම අන්ත දෙකටම නොපැමිණ 'අවිජ්ජා පච්චයා සංඛාරා... ' ආදී ක්‍රමයට මධ්‍යම ප්‍රතිපාදාවෙන් ධර්ම දේශනා කරන බවත්, ලොව සියල්ල තේරුම් කරන බවත් උන්වහන්සේ විසින් පෙන්වා දෙති.

බුදු දහමේ ඉගැන්වෙන මධ්‍යම ප්‍රතිපදා සංකල්පය අංශ දෙකක් ඔස්සේ විවරණය කොට ඇත. ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළින් ප්‍රකට කරනු ලබන්නේ බෞද්ධ මධ්‍යම ප්‍රතිපදාවේ චර්යාත්මක අංශයයි. අත්තකිලමතානු යෝගය හා කාමසුඛල්ලිකානුයෝගය යන අන්තවාදී චර්යාවන්ට නොවැටී ආර්ය අෂ්ටංගික මාර්ගය අනුගමනය කිරීම ප්‍රායෝගික වු මැදුම් පිළිවෙතයි. එහි ආචාර විද්‍යාත්මක අගයක්ද අන්තර්ගත වේ. පටිච්චසමුප්පාද දේශනාව තුළින් ඉදිරිපත් කරනුයේ මධ්‍යම ප්‍රතිපදාවේ දාර්ශනික අංශයයි. පටිච්චසමුප්පාද දර්ශනය තුළින් ලෝක සමුදය හා ලෝක නිරෝධය නිවැරදි ලෙස ප්‍රත්‍යවේක්ෂණය කිරීමටත්, එමගින් ශාස්වත උච්ඡේද ආදී විවිධ අන්ත වාදී දෘෂ්ටි වලින් බැහැරවීමටත් උගන්වන අතර මධ්‍යම ප්‍රතිපදා චින්තනය අවධාරණය කරයි. ලෝක සමුදය සම්‍යග් ප්‍රඥාවෙන් දකින විට නාස්තික දෘෂ්ටිය ප්‍රහීණ වන අතර ලෝක නිරෝධය සම්‍යග් ප්‍රඥාවෙන් දකින විට අස්තිතා හෙවත් ඇත යන්න ප්‍රහීණ වේ.



"ලොකසමුදයං ඛො කච්චායන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ නත්ථිතා සා න හොති. ලොක නිරොධං ඛො කච්චායන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ අත්තිතා සා න හෝති"[21]

මේ අනුව භෞතිකවාදය හා විඤ්ඤාණවාදය යන උභය අන්තයට නොවැටී පටිච්චසමුප්පාදය පදනම් කොට ගෙන බුදුරදහු මධ්‍යමික වු දර්ශනයක් ඉදිරිපත් කරති. ලෝකය පිළිබඳව යථා ස්වභාවයක් වන්නේද මේ උභය අන්තයෙන් මිදුණු මධ්‍යම පැවැත්මයි. සංයුත්ත නිකායේ නිදාන සංයුත්තයේ එන අචේලකස්සප සූත්‍රයේ අරමුණ දුක පිළිබඳ චතුෂ්කෝටික මිථ්‍යාවන් පටිච්චසමුප්පාදයෙන් විවරණය කිරීමයි. බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණෙන අචේල කස්සප,

දුක ස්වයං කෘත ද?
පරං කෘත ද?
දුක ස්වයං කෘත හා පරං කෘත ද?
අසයංකාර අපරංකාර අධිච්චසමුප්පන්න ද?

වශයෙන් එකිනෙක බුදුරජාණන් වහන්සේගෙන් විමසූ අතර දුක මෙම ආකාර සතරම නොවන බව උන්වහන්සේ වදාළහ. උන්වහන්සේගේ පිළිතුරින් විස්මිත වූ අචේල කස්සපට ශාස්වත දෘෂ්ටියට හෝ උච්ඡේද දෘෂ්ටියට ආදී කිසිඳු දෘෂ්ටියකට නොවැටී මධ්‍යම ප්‍රතිපදාවෙන් දහම් දෙසූහ.

"කාශ්‍යප, තථාගත තෙමේ ඒ මේ දෙ අන්තයටම නොපැමිණ මැදුම් පිළිවෙතෙහි සිටියේ දහම් දෙසයි. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වෙයි...මෙසේ මේ දුක් රැසේ හටගැනීම වේ...."[22]

එමෙන්ම සංයුත්තනිකායේ අවිජ්ජා පච්චය දේශනා සූත්‍රයට අනුවද පැහැදිලි කොට ඇත්තේ මෙම මධ්‍යම දේශනාවම වේ.

"තං ජීවං තං සරීරං වා භික්ඛු දිට්ඨියා සති බ්‍රහ්මචරිය වාසො නහොති. අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරංති වා භික්ඛු දිට්ඨියා සති බ්‍රහ්මචරිය වාසො නහොති. එතේතෙ උභො අන්තේ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දේසෙති. අවිජ්ජා පච්චයා සංඛාරා...."[23]

ශාස්වත දෘෂ්ටිය හා උච්ඡේද දෘෂ්ටිය යන අන්තවාදී ඉගැන්වීම් වලින් බැහැර වු පටිච්චසමුප්පාද දේශනාව පදනම් කොට ගත් මධ්‍යම ප්‍රතිපදා දර්ශනයක් බුදුදහමේ නිර්දේශ කරන බව යථෝක්ත සූත්‍ර දේශනා තුළින් ඉදිරිපත් කෙරේ. මෙම කරුණු උපුටා දක්වමින් ථෙරවාදීන් විසින් හඳුන්වා දෙනු ලබන්නේ බුදුහිමියන් විසින් පපටිච්චසමුප්පාද දේශනාව හුදෙක් දාර්ශනික ක්‍රමයක් යටතේ දේශනා කරන ලද්දක් බවයි.[24] සත්ත්වයාගේ ස්වභාවය, තථාගතයන්ගේ ස්වභාවය, ලෝක ස්වභාවය, දුක ආදී කවර දාර්ශනික ප්‍රස්තුතයක් සම්බන්ධයෙන් වුවද බෞද්ධ විවරණයන් ඉදිරිපත් කරනු ලබන්නේ පටිච්චසමුප්පාද මූලධර්මයෙන් බවද ඔවුන්ගේ මතයයි. විශේෂයෙන්ම සත්ත්වයා, පුද්ගලයා, ආත්මය, ජීවය යන්නෙන් සැලකෙන ආනුභවික යථාර්ථය සංස්කෘත ධර්ම වශයෙන් විශ්ලේෂණය කොට ආත්ම දෘෂ්ටියත් එයින් බිහිවන උච්ඡේද දෘෂ්ටියත් බැහැර කළ බුදුන් වහන්සේ විශ්ලේෂණයෙන් වෙන්කර දක්වන එම ධර්මයන් ස්වාධීන පදාර්ථ නොව අන්‍යෝන්‍ය වශයෙන් උපකාරිව පවත්නා බව දැක්වීම සඳහා පටිච්චසමුප්පාදයෙන් සංශ්ලේෂණය කර දක්වන ලද්දක් ලෙස ද ථෙරවාදීන් විසින් ඉදිරිපත් කොට තිබේ.[25] සත්ත්වයාගේ දුක පිළිබඳ ද්වාදශාංග පිළිබඳ විග්‍රහ කෙරෙන මහා නිදාන සූත්‍රයෙන් නාමරූප හා විඤ්ඤාණ අංග දෙක අන්‍යෝන්‍ය සාපේක්ෂකව බලපාන බව විග්‍රහ කරයි.[26] එකී අංග අනුපිළිවෙලින් තාර්කික අනුක්‍රමිකත්වයක් දැකිය හැකි අතර එකී අංග අතීත, වර්තමාන, අනාගත වශයෙන් ද විග්‍රහ කොට ඇත.

"ආනන්දය, මේ යම් ප්‍රත්‍යයකින් ජරාමරණය වේ නම් එසේ වූ ප්‍රත්‍යයෙක් ඇත්දැයි විචාරණ ලද්දාහු විසින් ඇතැයි



ඔහුට කියයුතු කිමෙක ප්‍රත්‍යයෙන් ජරාමරණ වේදැයි මෙසේ විචාරන්නේ නම් ජාති ප්‍රත්‍යයෙන් ජාරාමරණය වේ..... යැයි ඔහුට කිව යුතුය.... එසේ හෙයින් ආනන්දය, යම් මේ ජාතියෙක් වේද ජරාමරණයට මෙයම හේතු ය. මෙයම නිදාන ය. මෙයම සමුද ය. මෙයම ප්‍රත්‍යය"[27] වශයෙන් චතුරාර්ය සත්‍ය පිළිබදව මනා විග්‍රහයක යෙදේ. සංයුත්ත නිකායාගත සමණ බ්‍රාහ්මණ සූත්‍රය තුළින් ද චතුර්යාය සත්‍ය පිළිබඳ විග්‍රහයක් දැකිය හැකි ය. " මහණෙනි, යම්කිසි මහණෙක් හෝ බමුණු කෙනෙක් හෝ ජරාමරණ නොදකිත් ද, ජරාමරණ සමුදය නොදකිත් ද, ජරාමරණ නිරෝධය නොදකිත් ද, ජරාමරණ නිරෝධගාමිණී ප්‍රතිපදාව නොදකිත් ද....."[28]

මජ්ඣිම නිකායේ චූලසකුළුදායි සූත්‍රය තුළින් ලොවෙහි පවත්නා ඇතිවීම හා නැතිවීම පිළිබඳව මනා කොට හඳුන්වා දී ඇත. 'උදායි පූර්වාන්තයෙහි සිටීවා, අපරාන්තයෙහි සිටීවා තොපට දහම් දෙසන්නෙමි. මේ අවිද්‍යාදී ප්‍රත්‍ය ඇති කල්හි මේ සංස්කාරාදී ඵල වෙයි. මේ අවිද්‍යාදී ප්‍රත්‍යයාගේ උපැත්මෙන් මේ සංස්කාරාදී ඵලය උපදී. මේ අවිද්‍යාදී ප්‍රත්‍ය නැති කල්හි මේ සංස්කාරාදී ඵල නොවෙයි. මේ අවිද්‍යාදී ප්‍රත්‍යාගේ නිරෝධයෙන් මේ සංස්කාරාදී ඵල නිරුද්ධ වේ'[29] වශයෙනි. මජ්ඣිම නිකායේ මහා තණ්හාසංඛය සූත්‍රයෙහි පටිච්චසමුප්පාද දේශනාවෙහි අරමුණ නොවෙනස් වන ආත්මයක් පිළිබඳව පැවැති දෘෂ්ටිය බිඳ දැමීම පදනම් වූවකි.

"අනේක පරියායෙන ආවුසො සාති පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං භගවතා අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවොති."[30]

පටිච්චසමුප්පාද දේශනාවට අනුව අවිද්‍යාව මූලික වීමෙන් විඤ්ඤාණය පහළ වන බවත්, ප්‍රත්‍යයන්ගෙන් තොරව එම විඤ්ඤාණයෙහි ඇතිවීමක් සිදු නොවන බවත්, සාති භික්ෂුවට පටිච්ච සමුප්පාද න්‍යායට අනුව මෙහිදී බුදු හිමියන් දේශනා කොට ඇත. දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රයෙහි

පටිච්චසමුප්පාද දේශනාවෙහි අරමුණ වී ඇත්තේ දෙසැටක් මිත්‍යාදෘෂ්ටිය බිඳ හෙළීම ය.[31] මෙකී අරමුණම සංයුත්ත නිකායේ නිරුත්තිපථ සූත්‍ර දේශනයෙහි ද දැකිය හැකි ය.[32] සංයුත්ත නිකායේ වජිරා සූත්‍රයට අනුව ආත්ම සංකල්පීය වශයෙන් ගත යුතු කිසිම පදාර්ථයක් නොමැති බව දක්වා ඇත. එය හුදෙක් සංඛාර පුඤ්ජයක් පමණක් බවත්, ප්‍රතීත්‍ය සමුත්පාදානුකූලව සිදුවන බවත් විග්‍රහ වේ.

"යථාහි අංග සම්භාරා - හොති සද්දො රථො ඉති
එවං ඛන්ධෙසු සත්තෙසු - හොති සත්තොති සම්මුතී.
"දුක්ඛමේවහි සම්භොති - දුක්ඛං තිට්ඨති වෙතිච
නාඤ්ඤත්‍ර දුක්ඛා සම්භොන්ති -නාඤ්ඤත්‍ර දුක්ඛා නිරුජ්ඣති"[33]

අවයව සමූහය හේතුකොටගෙන මෙසේ රථය යන ශබ්දයෙක් වේ ද, එසේ ම පඤ්චස්කන්ධයන් ඇති කල්හි සත්ත්වයා යන ව්‍යවහාරය වේ. දුකම ලැබේ. දුකම පවතී. දුකම විඳී. දුක හැර අනෙකක් නොලැබේ. දුක හැර අනෙකක් නිරුද්ධ නොවේ යනුවෙන් එය විග්‍රහ වේ. සංයුත්ත නිකායේ අචේල කස්සප සූත්‍රයෙහි දුක පිළිබඳ සාකච්ඡාවක් වේ. දුක පිළිබඳ විවරණය කිරීම එහි මූලික අරමුණයි. "තෙනහි භවං ගොතමො දුක්ඛං න ජානාති. න පස්සතීති? නඛ්වාහං කස්සප දුක්ඛං න ජානාමි. න පස්සාමි. ජානාමි. ඛ්වාහං කස්සප පස්සාමි. ඛ්වාහං කස්සප දුක්ඛන්ති."[34] එසේ නම් භවත් ගෞතම තෙමේ දුක නොදනී ද? නොදකී ද? කාශ්‍යපය, මම දුක නොමදනිමි. නොමදකිමි. කාශ්‍යපය, මම දුක දනිම්මය. කාශ්‍යපය, මම දුක දකිම්ම ය. සංයුත්ත නිකායේ චේතනා සූත්‍රයට අනුව විඤ්ඤාණය මූලිකත්වයෙන් පටිච්චසමුප්පාද න්‍යාය සාකච්ඡා කරනු ලැබේ.

"යතො ච ඛො භික්ඛවෙ නො චේව චේතෙති නොච පකප්පෙති. නොච අනුසෙති. ආරම්මණමේතං න හොති විඤ්ඤාණස්ස ඨිතියා...."[35] (මහණෙනි, යම් කලෙක නොදසිතා



ද, නොද කල්පනා කෙරේ ද, නොද පවත්වා ද මෙය විඤ්ඤාණයේ පැවැත්මට අරමුණු නොවේ.)

සංයුත්ත නිකායේ බීජ සූත්‍ර දේශනාවෙහි අරමුණ පුද්ගලයාගේ පුනර්භවය ඇති වන ආකාරයත්, එය නැති කොට විමුක්තිය ලබාගත හැකි ආකාරයත්, බීජයක් පැලවෙන අයුරු උපමාවට ගනිමින් හේතු ඵල ධර්මතායට අනුව විග්‍රහ කිරීමත් ය.

"ඉදින් රූප ධාතුව පිළිබඳ රාගය මහණ හට ප්‍රහීණ වේද රාගයාගේ ප්‍රහාණයෙන් අරමුණ සිදෙයි, කර්ම විඤ්ඤාණයාගේ පිහිටීමෙක් නොවෙයි. මහණෙනි, ඉදින් මහණ හට වේදනා ධාතුව පිළිබඳ......මහණෙනි, ඉදින් මහණ හට සංඥාධාතුව පිළිබඳ.... මහණෙනි, ඉදින් මහණ හට සංස්කාර ධාතුව පිළිබඳ....මහණෙනි, ඉදින් මහණ හට විඤ්ඤාණ ධාතුව පිළිබඳ රාගය ප්‍රහීණවේ ද, රාගයාගේ ප්‍රහාණයෙන් අරමුණ සිදෙයි. කර්ම විඤ්ඤාණයාගේ පිහිටීමෙක් නොවේ. නොපිහිටි ඒ විඤ්ඤාණය විරූඪියට නොපැමිණියේ ප්‍රතිසන්ධිය අභිසංකරණය නොකොට මිදුණේ වෙයි. විමුක්ත හෙයින් ස්ථිත වෙයි. ස්ථිත හෙයින් සන්තුෂ්ට වෙයි. සන්තුෂ්ට හෙයින් ත්‍රස්ත නොවෙයි. ත්‍රස්ත නොවන්නේ තමා කෙරෙහිම පිරිනිවෙයි. ජාතිය ක්ෂය වී යැ. බඹසර වැස නිමවිණැ.........."[36]

රූප, වෙදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණස්ථිති සතර ප්‍රත්‍ය සහිත කර්ම විඤ්ඤාණය නන්දිරාගයෙන් යුක්ත වීම නිසා පුනර්භවය ඇති වේ. එසේම යමෙක් රූපය පිළිබඳ රාගය ප්‍රහීණ කළ හොත් ඒ පිළිබඳ අරමුණ සිදේ. එලෙසම වේදනා රාගය, සංඥා රාගය, සංඛාර රාගය ප්‍රහාණයෙන් අරමුණ සිඳී යයි. කර්ම විඤ්ඤාණය ප්‍රහීණ වීමෙන් විඤ්ඤාණය නැවත සකස් නොවේ. පුනර්භවයක් ඇති නොවෙයි. මෙසේ භවගාමී පුද්ගලයා පුනර්භවයෙන් මිදී විමුක්තිය ලබයි. මේ අනුව පටිච්චසමුප්පාද ධර්ම න්‍යායෙන් බීජ සූත්‍රය දේශනා කිරීමේ අරමුණ පටිච්චසමුප්පාද න්‍යායට අනුව පුනර්භවය ඇතිවන හා නැතිවන ආකාරය දැක්වීමට බවයි. මේ අනුව බුදුරජාණන් වහන්සේ

පටිච්චසමුප්පාද න්‍යාය ධර්මය මූලික බෞද්ධ ඉගැන්වීම් විවරණය කිරීම හා අන්‍ය ලබ්ධික දෘෂ්ටි විවරණය කිරීම ආදි විවිධ දාර්ශනික ප්‍රස්තුත විවරණය කිරීම උදෙසා භාවිත කර ඇති බව දැක්විය හැකි ය.

- **සමාජමය ප්‍රස්තුත විවරණය කිරීම**

විවිධ සමාජමය ප්‍රස්තුත විවරණය කිරීමෙහිලා පටිච්චසමුප්පාද න්‍යාය භාවිතව ඇත. සමාජ යථාර්ථය, සමාජීය විකාශනයන්, සමාජයේ විවිධ වූ කුසලාකුසල කර්ම, කලකොලාහළ, සමාජීය ගැටළු, ආර්ථික හා දේශපාලනික සාධක සමාජීය ප්‍රස්තුත කෙරෙහි බලපෑම ආදිය විවරණ උදෙසා බුදුන් වහන්සේ පටිච්චසමුප්පාද න්‍යාය යොදගෙන ඇති බව විවිධ සූත්‍ර මගින් පෙනේ. සමාජගත දුක විවරණයෙදී ඉන්ද්‍රිය ඤාණය පදනම් කර ගනිමින් මජ්ඣිම නිකායෙහි මධුපිණ්ඩික සූත්‍රය හා දීඝනිකායේ මහානිදාන සූත්‍රය දේශනා කර ඇත. සන්තානගත මනෝභාවයන්හී අනේකවිධ ක්‍රියාකාරිත්වය නිසා සමාජ ගත දුකද ඇති වේ යන සමාජ යථාර්ථය එයින් මැනවින් විග්‍රහ වේ. සමාජගත අසහන හා ආරවුල් පැහැදිලි කිරීම සඳහා මෙම සූත්‍රයේදී හේතු ප්‍රත්‍යයන් ඉදිරිපත් කරනුයේ තණ්හා අංගයේ සිටය. මිනිසා සිය තෘෂ්ණාව හේතුවෙන් ලෞකික දේ සෙවීමට වෙහෙස මහන්සි වී කටයුතු කරයි. සෙවීම හේතුවෙන් ලෞකික දේ ලැබේ. එකී ලබාගත් දෑ පිළිබඳ විවිධ ඇගයුම් කරයි. එම ඇගයීම හෙවත් විනිශ්චය හේතුවෙන් ඡන්දරාගය හටගනී. එකී ඡන්දරාගය නිසා අයත් කර ගනී. ලබාගත් හෙයින් අධික තෘෂ්ණාව හෙවත් මසුරු බව වෙයි. එකී අධික තෘෂ්ණාව නිසා ආරක්ෂා කරගැනීමට ආරක්ෂක විධිවිධාන යෙදීමටත්, අවිආයුධාදිය ගැනීමටත් සිදුවේ. ඒනිසා සමාජයේ පුද්ගලයන් සමග කලහ විවාද, ගර්හා කිරීම්, කේලම් කීම්, බැණ වැදීම හා බොරු කීම ආදී අසත් ධර්මයෝ ප්‍රභවය වෙති.

"වේදනං පටිච්ච තණ්හා, තණ්හං පටිච්ච පරියෙසනා, පරියෙසනං පටිච්ච ලාභො, ලාභං පටිච්ච විනිච්ඡයො, විනිච්ඡයං



පටිච්ච ඡන්දරාගො, ඡන්දරාගං පටිච්ච අජ්ඣෝසානං, අජ්ඣෝසානං පටිච්ච පරිග්ගහො, පරිග්ගහං පටිච්ච මච්ඡරියං, මච්ඡරියං පටිච්ච ආරක්ඛෝ, ආරක්ඛාධිකරණං අණ්ඩාදක සත්ථාදාන කලහ විග්ගහ විවාද තුවං තුවං පේසුඤ්ඤ මුසාවාදා අනේකේ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති."[37]

තෘෂ්ණාව නිසා වස්තු තණ්හාවත් එමගින් අසහනය, අසමගිය, ඊර්ෂ්‍යාව, කෝලහල හා ජීවිත හානිය ආදිය ඇතිවන ආකාරයත් (අනුලෝම ප්‍රත්‍යාකාරය) තෘෂ්ණාව අඩුකිරීමෙන් යටකී අසත් ධර්මයෝ අඩුකරන ආකාරයත් (ප්‍රතිලෝම ප්‍රත්‍යාකාරය) ද දීඝනිකායේ මහානිදාන සූත්‍රයෙන් පැහැදිලි වේ. එනම්, සමාජයෙහි දුක පුද්ගලයා කේන්ද්‍රත්වයෙන් හටගන්නා ආකාරය හේතු ඵල සම්බන්ධය අනුව මෙමගින් පැහැදිලි ය. එය පහත අයුරින් සාරාංශව දැක්විය හැකි ය.

| <u>හේතුව</u> | | <u>ඵලය</u> |
|---|---|---|
| තණ්හාව | නිසා | සෙවීම |
| සෙවීම | නිසා | ලැබීම |
| ලැබීම | නිසා | විමසීම |
| විමසීම | නිසා | ඇල්ම |
| ඇල්ම | නිසා | හීන බැඳීම |
| හීන බැඳීම | නිසා | අයත් කර ගැනීම |
| අයත් කර ගැනීම | නිසා | මසුරුකම |
| මසුරුකම | නිසා | ආරක්ෂා කිරීම |

ආරක්ෂා කිරීමට යාම නිසා නොයෙක් දුක් කම් කටෝලු (බොරු, ඇනුම්බැනුම්, කෝලාහල, දඬු, ආයුධ)

ඉන්ද්‍රියානුසාරයෙන් වින්දනයන් ලැබීමේදී තෘෂ්ණා, මාන හා දිට්ඨි ආදී ප්‍රපංචකරණ ක්‍රියාවලියට පත්කර නොගතහොත් ආරක්ෂාව සඳහා දඬු ගැනීම, සැත් ගැනීම, කලහ, විග්‍රහ, විරුද්ධ කතා, පිසුනුබස් කීම් හා මුසවාබිනීමට සිදුනොවන බව මජ්ඣිම නිකායේ මධුපිණ්ඩික සූත්‍රය පැහැදිලි කරයි.

'මහණ, යම් කාරණයෙකින් තෘෂ්ණාදෘෂ්ටි ප්‍රපඤ්ච සංඛ්‍යාත සංඥා කොට්ඨාසයෝ පුරුෂයා සහගත කොට පවතිද්ද, ඉදින් මෙකරුණෙහි (මමය, මාගේ ය යි) සතුටු විය යුත්තෙක් ගැල ගත යුත්තෙක් නැත්නම් මෙය ම රාගානුසයන්ගේ කෙළවර ය. මෙය ම පටිඝානුසයන්ගේ කෙළවර ය. මෙයම දිට්ඨානුසයයන්ගේ කෙළවර ය. මෙය ම විචිකිච්ඡානුසයයන්ගේ කෙළවර ය. මෙය ම මානානුසයයන්ගේ කෙළවර ය. මෙයම භවරාගානුසයයන්ගේ කෙළවර ය. මෙයම අවිජ්ජානුසයයන්ගේ කෙළවර ය. මෙයම දඬු ගැනීම, සැත් ගැනීම, කලහ, විග්‍රහ, විරුද්ධකථා, තෝ තෝ කීම්, පිසුනු බස, මුසවා යන මොවුන්ට කරුණු වූ චේතනාවන්ගේ කෙළවර වෙයි. මෙහි මේ ලාමක වූ අකුශල ධර්මයෝ නිරවශේෂයෙන් නිරුද්ධ වෙත්."[38]

සමාජ ගැටලු විෂයෙහි ආර්ථිකය හා දේශපාලනය බලපාන ආකාරය දීඝනිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රය දක්වයි. සමාජීය දූක පුද්ගලයා කේන්ද්‍රකරගෙන පමණක් නොව විවිධ ආයතනවල මෙන්ම පාලන තන්ත්‍රයන්හි දුර්වලතා මත ද ඇතිවිය හැකි ය. පුද්ගලයා සිය වස්තූන් වැඩිකරගැනීමටත්, ඒවා ආරක්ෂා කරගැනීමටත්, ප්‍රයත්න දරණ අතර අන්සතු වස්තු සොරකමට ද සමාජයේ පුද්ගලයෝ පෙළඹෙති. රටක පාලක පක්ෂය සිය යුතුකම් හා වගකීම් ඉටු නොකරන කල්හි සමාජයේ දිළිඳුකම පැතිරෙයි. ප්‍රමාණවත් ජීවන මාර්ග නොමැති කල්හි දිළින්දෝ අන්සතු වස්තූන් සොරකම් කිරීමට පෙළඹෙති. අටවන දළ්හනේමි රජතුමා පාලන ප්‍රතිපත්ති නොසලකා ස්වාභිමතය පරිදි රාජ්‍ය විචාළ හෙයින් රට පරිහානියට පත්විය. අමාත්‍ය උපදේශ නොතැකූ රජු දිළින්දන්ට ධනය නොදුන්නේය. නිර්ධනීන්ට ධනය නොදීමේ ප්‍රතිඵලය හේතුඵලවාදීව බුදුරජාණන් වහන්සේ මැනවින් විග්‍රහ කර ඇත.

| හේතු | | ඵලය |
|---|---|---|
| ▪ නිර්ධනීන්ට ධනය නොදීම | නිසා | දිළිදුබව පැතිරීම |
| ▪ දිළිදුබව පැතිරීම | නිසා | සොරකම පැතිරීම |



| | | |
|---|---|---|
| ▪ සොරකම පැතිරීම | නිසා | අවිආයුධ ගැනීම පැතිරීම |
| ▪ අවිආයුධ ගැනීම පැතිරීම | නිසා | ප්‍රාණඝාතය පැතිරීම |
| ▪ ප්‍රාණඝාතය පැතිරීම | නිසා | බොරු කීම පැතිරීම |
| ▪ බොරු කීම පැතිරීම | නිසා | කේලම් කීම පැතිරීම |
| ▪ කේලම් කීම පැතිරීම | නිසා | කාමමිථ්‍යාචාරය පැතිරීම |
| ▪ කාමමිථ්‍යාචාරය පැතිරීම | නිසා | එරුෂ වචන, හිස් වචන පැතිරීම |
| ▪ එරුෂ වචන හිස්වචන පැතිරීම | නිසා | දැඩි ලෝභය පැතිරීම |
| ▪ දැඩි ලෝභය පැතිරීම | නිසා | මිථ්‍යාදෘෂ්ටිය පැතිරීම |
| ▪ මිථ්‍යාදෘෂ්ටිය පැතිරීම | නිසා | අධර්මරාගය, විසම ලෝභය හා මිථ්‍යා ධර්ම පැතිරීම |
| ▪ අධර්මරාගය, විසම ලෝභය හා මිථ්‍යා ධර්ම පැතිරීම | නිසා | මවට, පියාට, මහණුහට, බමුණට නොසැළකීම. |
| ▪ මවට, පියාට, මහණුහට, බමුණට නොසැළකීම. | නිසා | ආයු වර්ණ පිරිහිම |
| ▪ ආයුවර්ණ පිරිහිම | නිසා | මව, සුළු මව ආදි හැඟිම නොමැතිව කුලදම් බිඳ තිරිසනුන් මෙන් දූරාචාරයෙහි යෙදිම. (මෘග සංඥාව) |
| ▪ මව, සුළු මව ආදි හැඟිම නොමැතිව කුලදම් බිඳ තිරිසනුන් මෙන් දූරාචාරයෙහි යෙදිම. (මෘග සංඥාව) | නිසා | ආයුධ වලින් එකිනෙකා මරා ගැනීම.[39] |

මේ අනුව සමාජ ප්‍රශ්න පුද්ගල කේන්ද්‍රියව සංස්ථාව මූලිකව පමණක් නොව ආර්ථික දේශපාලනික හේතු පදනමකින් විවරණය කිරිම බුදුසමයෙහි දක්නට ලැබෙන බව පෙනේ. මිනිස් සමාජයේ ප්‍රභවය හා පරිනාමය සමඟ විවිධ විෂමතාවන් ලොව ප්‍රකට වූ ආකාරය විවරණය කිරීමට දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රය හේතු ඵල න්‍යාය යොදාගෙන ඇත. සමාජයේ කුල භේදය මහාබ්‍රහ්මගේ නිර්මාණයක් බව දැක්වූ බ්‍රාහ්මණයන්ගේ මතය බිඳ පටිච්චසමුප්පාද ධර්මතාවට අනුව ලෝකයේ හට ගැනීම ශාක හා සත්ත්ව පද්ධතිවල ප්‍රභවය, මිනිසා පරිසරය හා සමාජ සංස්ථාවල අන්‍යොන්‍ය සබැඳියාව මනාව විග්‍රහ වේ. ජල කඳින් හා අන්ධකාරයෙන් වෙලී පැවති ලෝකය හිරු, සඳු,

තාරකා හා පෘථුවිය හටගැනීමත්, ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් පැමිණි ජීවියෙකුගේ ලෝලි ස්වභාවය නිසා රස පොළව දිව ගා බැලීම නිසා තෘෂ්ණාව සිතට ඇතුළුවී මනෝ කායිකව ස්වයං ප්‍රභා සහිත ප්‍රීතිය අනුභව කරමින් සිටි ඔවුන්ගේ ස්වයං ප්‍රභාවයත්, ආකාශ ගාමී ශක්‍යතාවත් අතුරුදන්ව දෘඪ ශරීරයක් දක්වා ක්‍රමක්‍රමයෙන් පරිවර්තනය වීමත්, ලිංග භේදය, රෑ දහවල් ආදිය ඇති වී ලෝකය ඇති වූ අයුරුත් අග්ගඤ්ඤ සූත්‍රය විග්‍රහ කරයි. එසේ ම ශරීරාවර්ණයේ භේදය නිසා ජීවීන් තුළ මානය හා අතිමානය ඇති වූ ආකාරයත්, කම්මැලි පුද්ගලයෙකු හැල් වී දවස් කිහිපයකට අවශ්‍ය ප්‍රමාණයට රැස්කර ගැනීමෙන් රැස්කර තබාගෙන ආහාර ගැනීමේ ක්‍රමයක් ආරම්භ විය. එමගින් ඇතැමෙකුට හැල් වී නොමැති වීමත් එනිසා ඇති අයගෙන් සොරකම් කිරීමත්, සොරකම් කළවුන්ට දඬුවම්දීමත්, අතින් පයින් ගැසීමත්, බොරු කීමත් යන අසත් ධර්මයෝ ඇති විය. එකී අසත් ධර්මයන් පාලනය කිරීමට මහජන මතයෙන් 'මහා සම්මත' නමින් පාලකයෙකු පත්කර ගැනීමෙන් පාලන සංස්ථාව බිහි විය. එසේ ම ඔවුන් කෙත්වලට අධිපති වූ හෙයින් 'ඛත්තිය' නම් විය. සමාජයේ ලාමක අකුසල් බැහැර කළ පිරිස 'බ්‍රාහ්මණ' නමින් ද, කාමසුව විඳිමින් ගවපාලනය ආදී කර්මාන්ත කරමින් සිටි පිරිස් 'වෛශ්‍ය'' නමින් ද, සමාජයේ අනික් සුළු වැඩ කරමින් සිටි අය 'ශුද්‍ර' නමින් ද හැඳින්වූහ. එය චතුර්වර්ණයේ ප්‍රභවයයි.[40] මේ අනුව අග්ගඤ්ඤ සූත්‍රය ලෝකයේ ප්‍රභවය, මානව සංහතියේ පරිනාමය, රජු හා පාලන සංස්ථාව බිහිවීමත් චතුර්වර්ණයේ පහළවීමත් විග්‍රහ කරනුයේ හේතු ඵල දහම අනුවය. නොයෙක් අසත් ධර්මයන්ගේ පහළවීමෙන් සංස්ථාගත දුක ඇතිවන ආකාරය ද හේතු ඵල දහම අනුව අග්ගඤ්ඤ සූත්‍රය විවරණය කරයි.

දීඝ නිකායේ සක්ක පඤ්හ සූත්‍රයෙහිදී සක්‍රයාගේ පැනයන්ට පිළිතුරු දෙන බුදුරජාණන් වහන්සේ විවිධ සන්තානගත හා සංස්ථාගත දුක්ඛ හටගන්නා ආකාරය පටිච්ච සමුප්පාද න්‍යාය අනුව විග්‍රහ කරයි.



"දෙවිඳ ඊර්ෂ්‍යා මාත්සය්‍ය දෙක ප්‍රියාප්‍රිය සත්ත්වයන් නිදාන කොට ඇත්තේ ය. ප්‍රියාප්‍රිය සත්ත්වයන් සමුදය (කාරණ) කොට ඇත්තේ ය. ප්‍රියාප්‍රිය සත්ත්වයන් ජාති (උත්පත්තිස්ථාන) කොට ඇත්තේ ය. ප්‍රියාප්‍රිය සත්ත්වයන් ප්‍රභව (උපාදාන තැන්) කොට ඇත්තේ ය. ප්‍රියාප්‍රිය සත්ත්වයන් ඇති කල්හි ඊර්ෂ්‍යා මාත්සය්‍ය දෙක වෙයි. ප්‍රියයක්හු හෝ අප්‍රියයක්හු නැති කල්හි ඊර්ෂ්‍යා මාත්සය්‍ය දෙක නොවේ."[41]

ඡන්ද රාගය, විනිච්ඡය, විතර්කය, සෙවිය යුතු සොම්නස, නොසෙවිය යුතු සොම්නස, කාය වාක් සමාචාරය, ඉන්ද්‍රිය සංවරය, ලබ්ධි සහිත බමුණන් හා දඬු ආයුධ ගැනීම් ආදිය පිළිබඳ සක්‍රයාගේ පැනයන්ට පිළිතුරු සපයනුයේ පටිච්ච සමුප්පාද ධර්ම න්‍යායට අනුව ය.[42] පටිච්චසමුප්පාදය පදනම් කරගනිමින් එකිනෙකා අතර කලිකලහ, විවාද ආදිය ඇතිවන ආකාරය සුත්ත නිපාතයේ කලහ විවාද සූත්‍රයෙන් පැහැදිලි වේ.

"කලහයෝත්, විවාදයෝත්, පරිදේව ශෝකයෝත්, මාත්සය්‍යයෝත්, මාන-අතිමානයෝත්, පෛශුන්‍යයෝත් යන මොවුහු අටදෙනා ප්‍රිය වස්තූහු කෙරෙන් උපන්හ. කලහ විවාදයෝ ද (පරිදේව, ශෝක, මාන, අතිමාන, පෛශුන්‍යයෝ ද) මාත්සය්‍යය හා යෙදුනාහු වෙත්. විවාද උපදුත් ම පිසුනු බස් උපදනේ ය."[43]

සමාජ ගැටලු විෂයෙහි පුද්ගල සන්තානය ක්‍රියාකාරීත්වය මෙන් ම ආර්ථික දේශපාලනික තත්ත්වයන් ද සාධක වන බව යථෝක්ත දේශනා විවරණ තුළින් පෙනේ. එනම් විවිධ සමාජ ප්‍රස්තුත විවරණය සඳහා න්‍යායක් වශයෙන් බුදුරජාණන් වහන්සේ පටිච්චසමුප්පාද න්‍යාය ධර්මය යොදාගත් බවයි.

- **භෞතික හා මානසික ක්‍රියාදාමයන් විවරණය කිරීම**

බුදුරජාණන් වහන්සේ ප්‍රතීත්‍ය සමුත්පන්න න්‍යාය විවිධ භෞතික සාධකවල ක්‍රියාකාරීත්වය විස්තර කිරීමට ද යොදාගෙන

ඇති බව පෙනේ. මැදුම් සඟියට අයත් අග්ගිවච්ඡගොත්ත සූත්‍රයට අනුව එහි අරමුණ වනුයේ ගින්න උපමාවට ගනිමින් භෞතික ධර්මයන් කෙරෙහි ද හේතු ප්‍රත්‍යය ධර්මයන් බලපාන බව විදහා දැක්වීම ය. දශ අව්‍යාකෘත හා තථාගත ප්‍රශ්න පිළිබඳ මෙහිදී විවරණය වන අතර එකී ප්‍රශ්න අර්ථශූන්‍ය බව බුදුන් වහන්සේ විග්‍රහ කළේ ගින්න යන භෞතික සාධකය උපමාවට ගනිමිනි.

"තොප ඉදිරියේ යම් ගින්නක් දිලේද මේ ගින්න කුමක් නිසා දිලිසේද.... භවත් ගෞතමයනි, මා මෙසේ විචාරා නම් ; තොප ඉදිරියෙහි යම් ගින්නක් දිලිසේ ද, ඒ ගින්න කුමක් නිසා දිලිසේ දැයි, භවත් ගෞතමයනි, මම මෙසේ විචාරන ලද්දෙම් මෙසේ කියන්නෙමි. මා හමියෙහි යම් ගින්නෙක් දිලිසේද, මේ ගින්න තෘෂ්ණකාෂ්ටෝපාදනය නිසා දිලේයැයි මෙසේ ප්‍රකාශ කරමි. ඉතින් වත්සය, ඒ ගින්න තොප හමියෙහි නිවේ නම් මේ ගින්න මා හමුවේ නිවිණැයි දන්නහුද?... තොප හමියෙහි යම් ගින්නක් නිවියේ නම් ඒ ගින්න මෙයින් කවර දිගකට ගියේද පෙර දිගට හෝ අවරදිගට හෝ උතුරුදිගට හෝ දකුණුදිගට හෝ යැයි... යම් හෙයකින් භවත් ගෞතමයනි, ඒ ගින්න යම් තෘණකාෂ්ටෝපාදානයක් නිසා දිලිණිද ඒ උපාදානයාගේ ක්ෂය වීමෙන් ද අන්‍ය උපාදානයක්හුගේ නොඑළැවීමෙන්ද, අප්‍රත්‍යය වැ නිවිණැ... "[44]

අග්ගිවච්ඡගොත්ත සූත්‍රයෙහි භෞතික ධර්ම උපමා කොට ගත්තාසේම සංයුක්ත නිකායේ උපනිසා සූත්‍රයෙහි සාංසාරික දුක පටිච්චසමුප්පාදානුකූලව ස්වභාවික භෞතික ක්‍රියාකාරිත්වය ඇසුරින් කෙරෙන විග්‍රහයක් දැකිය හැකිය.

"මහණෙනි, කඳුමුදුනක මහත් දියබිඳු ඇති වැසිවස්නා කල්හි ඒ දිය පහත් බිම් අනුව පවත්නේ කඳු බෑවුම් පැලී විවර හා කුඩා දිය අගල් යම් සේ පුරවාද , කඳු බෑවුම් පැලී විවර සහ කුඩා දිය අගල් පිරුණාහු කුඩා වලවල් පුරවත් ද, කුඩා වලවල් පිරුණාහු මහ වලවල් පුරවත්ද, මහ වලවල් පිරුණාහු කුඩා



ගංගා පුරවත්ද, කුඩා ගංගා පිරුණාහු මහ ගංගා පුරවත්ද, මහ ගංගා පිරුණාහු මහ සමුදුර පුරවත්ද, මහණෙනි, එපරිද්දෙන්ම සංස්කාරයෝ අවිද්‍යාව ප්‍රත්‍යය කොට ඇත්තාහ. විඥානය සංස්කාර ප්‍රත්‍යය කොට ඇත්තේය. නාම රූප විඥානය ප්‍රත්‍යය කොට ඇත්තේය. ෂඩායතන නාමරූප ප්‍රත්‍යය කොට ඇත්තේය.... "[45]

පටිච්ච යන්නට මෙම සූත්‍රයේදී උපනිසා යන පදය යොදාගෙන තිබීම මෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. කඳු මුදුනින් දිය බිඳකින් ඇති වන ගංගා මගින් මහ සමුදුර පුරවන්නා සේ සංස්කාර ධර්මයන්ගේ හේතු ප්‍රත්‍යය පිළිබඳව මනා විග්‍රහයකි. එනම් භෞතික ක්‍රියාකාරිත්වය උපමාවට ගනිමින් සසර දුක විවරණය කිරීම මෙහි අරමුණ වී ඇත. සංයුත්ත නිකායේ අභිසමය සංයුත්තෙහි ආහාර සූත්‍රයෙහිදී ආහාරය මූලික කරගනිමින් තෘෂ්ණාව හේතු කොටගෙන සසර දුක ඇති වන අයුරු පැහැදිලි කරනුයේ හේතුඵල න්‍යායට අනුවය.

"මහණෙනි, උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසත් උපන්නා වූ සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසත්, මේ ආහාර සතරෙකි. කවර සතරෙක්ද? යත්; දළ වූ හෝ සියුම් වූ හෝ කබලීකාර (පිඩුකොට බුදින බත් ආදී) ආහාරය, ස්පර්ශය දෙවැන්නය, මනෝ සංචේතනාව තෙවැන්නය. විඥානය සිව්වැන්නය. මහණෙනි, මේ සතර ආහාරයෝ උපන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිසත් උපදින්නා වූ සත්ත්වයන්ට අනුග්‍රහ පිණිසත් වෙති..... මේ සතර ආහාරයෝ තෘෂ්ණාව නිදාන කොට, තෘෂ්ණාව හේතුකොට, තෘෂ්ණාව ජාතිකොට, තෘෂ්ණාව ප්‍රභව කොට ඇත......... "[46]

මානසික සාධක හෙවත් මානසික ක්‍රියාදාමයන් විවරණය කිරීම ද පටිච්ච සමුප්පාදයේ තවත් අරමුණකි. සාංසාරික දුක්ඛ ප්‍රභවයට හේතු ප්‍රත්‍ය හෙවත් මූලික වනුයේ මනස ය. එකී දුක්ඛ නිරෝධය ද මානසික ක්‍රියාදාමයකි. සන්තානගත හා සංස්ථාගත

දුක්ඛයන් උදෙසා මානසික බලපෑම විවිධ සූත්‍රයන්හි විවරණය කොට ඇත. තෘෂ්ණාව, උපාදානය හා විඤ්ඤාණය ආදී මානසික සාධකවල අන්‍යොන්‍ය බලපෑමත් එහි ඵල වශයෙන් පැන නැගෙන මානසික, භෞතික හා සමාජ තත්වයන් පිළිබඳව බුදුරජාණන් වහන්සේ විවිධ ආකාරයෙන් විග්‍රහ කළහ. සියල්ලට ම මනස මූලික වේ. මානසික ක්‍රියාදාමයන් පටිච්ච සමුප්පාද න්‍යායානුසාරයෙන් විග්‍රහ කිරීම අරමුණු කොට ගත් සූත්‍ර දේශනා කිහිපයකි. මජ්ඣිම නිකායෙහි මධුපිණ්ඩික සූත්‍රය හා දීඝ නිකායෙහි මහා නිදාන සූත්‍රය ඉන්ද්‍රිය ඥානය පදනම් කර ගෙන පටිච්ච සමුප්පාදය විවරණය කරයි. මිනිස්සු තෘෂ්ණා, මාන, දෘෂ්ටි සංඛ්‍යාත ප්‍රපඤ්ච බවට පත්කර ගෙන ඉන්ද්‍රියන් ඇසුරෙන් වින්දනයන් විඳීමේ ඵලය වශයෙන් සසර දුක ඇති වන ආකාරය මධුපිණ්ඩික සූත්‍රය දක්වයි. භව ගමනට මඟ තනන කර්ම රැස් නොකරන ත්‍රිලක්ෂණානුකූලව ලෝකය දකින භාවිත සිත් ඇත්තා භව ගමන නිරුද්ධ කරන ආකාරයත් මධුපිණ්ඩික සූත්‍රයේ දක්වයි.

''ඇවැත්නි, ඇස ද රූපයන් ද නිසා චක්ෂුර් විඤ්ඤාණය උපදී. මේ තුන්දෙනාගේ එක් වීමෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශය නිසා වේදනාව වෙයි. යමක් උපදී ද එය හඳුනයි. යමක් හඳුනා ද එය විතර්කණය කෙරෙයි. යමක් විතර්කණය කෙරේ ද එය ප්‍රපඤ්චයට පමුණුවයි. යමක් ප්‍රපඤ්චයට පමුණුවා නම් ඒ චක්ෂුරූපාදී කාරණයෙන් (තෘෂ්ණාදෘෂ්ඨී) ප්‍රපඤ්චයන්ගෙන් යුක්ත සංඥා කොට්ඨාසයෝ අතීතානාගත වර්තමාන හෝ ඇසින් බලා දත යුතු වූ රූපයෙහි පුරුෂයා අභිභවනය කෙරෙත්. ඇවැත්නි, කණ ද ශබ්දයන් ද නිසා ශ්‍රෝත විඤ්ඤාණය උපදී. ඇවැත්නි, නැහැය ද ඝ්‍රාණවිඤ්ඤාණය උපදී.....''[47] මේ අනුව විඤ්ඤාණයෙහි ප්‍රභවයත් එකී විඤ්ඤාණයෙන් ප්‍රපංචකරණයට ගොදුරුවන අයුරු මෙනයින් මැනවින් හඳුනාගත හැක. මහානිදාන සූත්‍රය දක්වනුයේ තෘෂ්ණාව හේතුවෙන් විවිධ දේ මහන්සියෙන් සොයා ගන්නා අතර ඒවා කෙරේ දැඩිව ඇලීම නිසා මිනිසාට විවිධ දුක්වලට මුහුණපෑමට සිදුවන බවයි.[48]



"වේදනාව නිසා තෘෂ්ණාව වේ. තෘෂ්ණාව නිසා පර්යේෂණය (අරමුණ සේවිම) වේ. පර්යේෂණය නිසා ලාභය (අරමුණු ලැබීම) වේ. ලාභය නිසා විතර්ක විනිශ්චය (අරමුණෙහි ඉටු අනිටු බව විතර්කයෙන් විනිශ්චය කොට ගැන්ම) වේ. විනිශ්චය නිසා ඡන්දරාගය (විතර්කිත වස්තුව කෙරෙහි ඇල්ම) වේ. ඡන්දරාගය නිසා අධ්‍යවසානය (මමය මගේ යැයි බලවත් සනිටුවහන) වේ. අධ්‍යවසානය නිසා පරිග්‍රහය (තෘෂ්ණා දෘෂ්ටි විසින් මගේ යැයි අයත් කරගැන්ම) වේ. පරිග්‍රහය නිසා මසුරුබව වේ. මසුරුබව නිසා රැක්ම වේ. රැක්ම කරනකොට ගෙන දඬුමුගුරු දැරුම්, අවි දැරුම්, කලහ, විග්‍රහ (විරෝධපෑම්), විවාද, තුවංතුවං වාද (ඇනුම් බැණුම්), කේලම්, මුසාබිණුම්, නොයෙක් ලාමක අකුසල් දහම්හු පහළවෙත්.'[49] ද්වතානුපස්සනා සූත්‍රය ද සසර දුක්ඛ ප්‍රභවයට විඤ්ඤාණය ප්‍රත්‍ය වන බව දක්වයි. ''යම්කිසි සසර දුකෙක් උපදනේ නම් ඒ හැම දුක් අභිසංස්කාරවිඥානප්‍රත්‍යයෙනි. අභිසංස්කාර විඤ්ඤාණයාගේ නිරෝධ හේතුයෙන්ම වර්තදුඃඛයාගේ සම්භවයෙක් නැත.''[50]

හේතුව හා ඵලය සාපේක්ෂව විද්‍යමාන වන බව දක්වන සංයුත්ත නිකායේ නළකපාල සූත්‍රය බටලී දෙකක උපමාවක් එකී විග්‍රහයට උපයෝගී කර ගනී. එයින් නාමරූප හා විඤ්ඤාණය අතර පවතින සාපේක්ෂ සම්බන්ධයත් හුදු දුක් රැසේ හට ගැන්මත් විග්‍රහ කරයි. ''ඇවැත්නි, යම් සේ නළකපාල දෙකක් ඔවුනොවුන් ඇසුරු කොට සිටුනේ ද, ඇවැත්නි, එසෙයින් ම නාම රූප ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය වේ. විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප වේ. නාමරූප ප්‍රත්‍යයෙන් සළායතන වේ. සළායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ. .... මෙසේ මේ හුදු දුක් රැසේ හට ගැනීම වේ....''[51]

විඤ්ඤාණය පහළවීමට හේතු ප්‍රත්‍ය සමූහයක් බලපාන බවත්, පස්වැදෑරුම් උපාදානස්කන්ධයන්ගේ සංග්‍රහය, සන්නිපාතය, එක්රැස්වීමත්, දුක්ඛ සමුදය හා දුක්ඛනිරෝධය පිළිබඳ විග්‍රහයක් මැදුම් සඟියෙහි මහාහත්ථිපදෝපම සූත්‍රයෙහි දැකිය හැකි ය.

ශ්‍රී ලංකා භික්ෂු ... 23 JUL 2019

"ඇවැත්නි, ඉදින් ආධ්‍යාත්මික වූ ඇස නොබිඳුණේ වේ නම් බාහිර රූපයෝ ඇස් හමුවට නොපැමිණෙත් නම් එයින් උපදනා (ඇසත් රූපත් නිසා) මනසිකාරය (මෙනෙහි කිරීම) නොවේ නම් ඒ තාක් ඊට අනුරූප වූ විඤ්ඤාණභාගයාගේ පහළවීම නොවෙයි. ඇවැත්නි, ආධ්‍යාත්මික වූ චක්ෂුඃප්‍රසාදය නොබිඳුණේ වේද, බාහිර රූපයෙන් ඇස් හමුවට පැමිණෙත් ද (එහෙත්) ඊට අනුරූප වූ මෙනෙහි කිරීම නොවෙයි නම් ඒ තාක් සදනුරූප වූ චක්ෂුර්විඥානයාගේ පහළවීම නොවේම ය. ඇවැත්නි, යම් හෙයකින් ආධ්‍යාත්මික වූ චක්ෂුඃප්‍රසාදය නොබිඳුණේ වේ ද බාහිර රූපයෙන් ඇස් හමුවට පැමිණෙත් ද ඊට අනුරූප වූ මෙනෙහි කිරීමක් වේ ද මෙසේ ඊට සුදුසු විඥානභාගයාගේ පහළවීම වෙයි.......මේ උපාදානස්කන්ධයෝ පස්දෙන පටිච්චසමුප්පන්නයෝ වෙති. මේ උපාදානස්කන්ධ පසෙහි යම් ඡන්දරාගයෙක්, ආලයෙක්, සෙනෙහසෙක්, ගැලීසිටීමෙක් වේ ද එය දුක්ඛසමුදයයි. මේ උපාදානස්කන්ධ පසෙහි යම් ඡන්දරාගවිනයෙක් වේ ද ඡන්දරාග ප්‍රහීණයෙක් වේ ද එය දුක්ඛනිරෝධයයි....."[52]

ඇසත් රූපත් හමුවීම පමණකින්ම විඥානය පහළනොවන බවත් ඊට අදාළ හේතුප්‍රත්‍ය සමුදායක් පවතින බවත් මෙහි දැක් වේ. එනම්,

- ඇසෙහි පෙනීමේ ශක්තිය (චක්ඛුං අපරිභින්නං හෝති)
- බාහිර රූපාරම්මණය හමුවීම (බාහිරාච රූපා ආපාථං ගච්ඡති)
- ආරම්මණය කෙරෙහි පුද්ගල මානසික අවධානය යොමුවීම (තජ්ජෝ ච සමන්නාහාරෝ හෝති)[53]

වශයෙනි. මැදුම් සඟියේ මහාතණ්හාසංඛය සූත්‍රයෙහි ද මීට සමාන විග්‍රහයක් දැකිය හැකි ය. භාවිත සිතක් නැත්තා ප්‍රිය රූපවල සංරාග කරන ආකාරයත් අප්‍රිය වූ රූපයෙහි ගැටෙයි.



එකී ඇලීම තණ්හාවයි. තණ්හාව හේතුවෙන් උපාදානය වේ. උපාදාන ප්‍රත්‍ය හෙවත් මනසින් දැඩිව ග්‍රහණය කර ගැනීම නිසා සත්ත්වයෝ අඛණ්ඩව පැවතීමේ චිත්තය සකස් කිරීම (භව) වෙයි. එයින් සත්ත්වයාගේ දුක් සමූහය උදාවීම වන ආකාරය දක්වයි.

"හේ ඇසින් රූප දැක ප්‍රිය රූප වූ රූපයෙහි සංරාග කෙරෙන් අප්‍රිය රූප වූ රූපයෙහි ව්‍යාපාද උපදවයි. අකුසල් සිතැතිව නො එළඹ සිටි කායියාසි ඇතිවද වාස කෙරෙයි..... හේ මෙසෙයින් රාග, ද්වේෂ දෙකට පැමිණියේ සුඛවේමය, දුඃඛ වේවයි, අදුඃඛාසුඛ වේවයි, යම්කිසි වේදනාවක් විඳුණේ වේ ද, ඒ වේදනා (තෘෂ්ණාවෙන්ම) අභිනන්දනා කෙරෙයි. (අහෝ සුවයෙකියි) බෙණේ. ඔහුට ඒ වේදනායෙන් තුස්නාහට, බණනුවාහට, ගැලගෙන සිටුනාහට තෘෂ්ණා උපදී. වේදනායෙහි යම් නන්දියෙක් ඇත් ද ඒ උපාදාන වෙයි. ඔහුට උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. භව ප්‍රත්‍යයෙන් ජාති වෙයි. ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණශෝකපරිදේවදුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ පහළවෙති. මෙසෙයින් තෙල කේවල දුඃඛපුඤ්ජයාගේ උදාවීම වෙයි......"[54]

පටිච්චසමුප්පාද න්‍යාය මගින් බුදුරජාණන් වහන්සේ මූලිකව දුක හට ගන්නා ආකාරයත්, එය නිරුද්ධ කරන ආකාරයත්, මිනිසාට විසඳාලීමට අපේක්ෂා කළ අතර එකී න්‍යාය විවිධ අයුරින් දේශනා කළහ. භෞතික පරිසරයේ ක්‍රියාකාරීත්වය, දාර්ශනික ප්‍රස්තුත, මිනිසා හා මිනිස් ක්‍රියාකාරීත්වය මෙන් ම තෘෂ්ණාව, විඥානය, උපාදානය, ක්‍රෝධය, වෛරය ආදී මානසික තත්ත්වද, දේශපාලන හා ආර්ථික ආදී ප්‍රස්තුත විග්‍රහ කිරීමට ද පටිච්චසමුප්පාද න්‍යාය ධර්මය යොදාගෙන ඇති බව පෙනේ. එකී න්‍යායෙහි අර්ථ ක්‍රියාකාරීත්වය අතිශයින් සුඛනම්‍යය වන අතර එහි විවිධ පර්යාය ලක්ෂණයෝ ද වෙති. යථෝක්ත සූත්‍ර පිටකාගත සූත්‍ර දේශනා අනුව සත්ත්වයාගේ ආවසානික ඵලය වන නිර්වාණය සාක්ෂාත්කරණය සඳහා සන්තානගත හා සංස්ථාගත දුක්ඛ ප්‍රභවය හා ප්‍රහාණය විවරණය සඳහා උපයුක්ත

දේශනාව පටිච්චසමුප්පාදය බවත්, විවිධ අරමුණු විෂයෙහි පටිච්චසමුප්පාදය මූලධර්මයක් ලෙස උපයුක්තව ඇති ආකාරයත් මැනවින් හඳුනා ගත හැකි ය.

## ආන්තික සටහන්


1. මජ්ඣිම නිකාය, (මහාතණ්හාසංඛය සූත්‍රය) බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1964, පිටු 616-620.
2. සංයුත්ත නිකාය 1, (සේලා සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටු 244
3. ලෞකික බුදුදහම සිද්ධාන්ත සහ භාවිතය, චන්ද්‍රාවික්‍රමගමගේ,
4. අබයවර්ධන, එච්. ඒ. පී., (සංස්), මහරගම : අහල් ප්‍රකාශන,2011, පිටු 45 - 49
   ලෞකික බුදුදහම සිද්ධාන්ත සහ භාවිතය, චන්ද්‍රාවික්‍රමගමගේ, අබයවර්ධන,
   එච්. ඒ. පී., (සංස්), මහරගම : අහල් ප්‍රකාශන, 2011, පිටුව 50.
5. චන්දිම විජේබණ්ඩාර, එච්.එම්. මොරටුගම, බෞද්ධ දර්ශනය සහ සංස්කෘතිය, කොළඹ : එස්.ගොඩගේ සහ සහෝදරයෝ, 1980, පිටුව 48.
6. සංයුත්ත නිකාය 2, (නළකපාල සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටු 180 .
7. සංයුත්ත නිකාය 3, (බීජ සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටු 94 - 97.
8. සංයුත්ත නිකාය 4, (අනුරාධ සූත්‍රය) බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 680.
9. සංයුත්ත නිකාය 2, (පච්චය සූත්‍රය) බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 42.
10. සංයුත්ත නිකාය 2, (අචේල කස්සප සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 30.
11. සංයුත්ත නිකාය 2, (විභංග සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 4.
12. කළුපහන, ඩී.ජේ., බෞද්ධ දර්ශන ඉතිහාසය, නුගේගොඩ: පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්, 2003, පිටුව 51.
13. සංයුත්ත නිකාය 2, (පච්චය සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව.43.
14. සංයුත්ත නිකාය 2, (කච්චායන ගොත්ත සූත්‍රය) බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව.28.
15. සංයුත්ත නිකාය 2, (සමණ බ්‍රාහ්මණ සූත්‍ර) බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 2006, පිටු 24-29.
16. සංයුත්ත නිකාය 2, (උපනිසා සූත්‍රය) බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 2006, පිටුව 50.
17. දීඝ නිකාය 2., (මහානිදාන සූත්‍රය) බු.ජ.ත්‍රි.ග්‍ර.මා.,2005, පිටුව.83.
18. සංයුත්ත නිකාය 4., (අනුරාධ සූත්‍රය) බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 2006, පිටුව 680.
19. සංයුත්ත නිකාය, (වාසෙට්ඨ සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1960, පිටු 200-201.
20. සංයුත්ත නිකාය, (ලෝකායතික සූත්‍රය) බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1960, පිටුව 120.
21. සංයුත්ත නිකාය, (කච්චානගොත්ත සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1960, පිටුව 28.
22. සංයුත්ත නිකාය 2, (අචේල කස්සප සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1960, පිටුව 35.
23. සංයුත්ත නිකාය. (අවිජ්ජාපච්චය සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1960, පිටුව 94.





24. ශාස්ත්‍රීය සංග්‍රහය, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම, 1992, පිටුව 136.
25. දේවාලේගම මේධානන්ද හිමි, බෞද්ධ අධ්‍යයන ප්‍රවේශය, කැළණිය : නිව් දීපා මුද්‍රණාලය, 1997. පිටුව 93.
26. දීඝ නිකාය, (මහානිදාන සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1972 පිටුව 80.
27. දීඝ නිකාය, (මහානිදාන සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1972 පිටු 80 - 82.
28. සංයුත්ත නිකාය, (සමණ බ්‍රාහ්මණ සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1962, පිටුව 24.
29. මජ්ඣිම නිකාය 2, (චූලසකුළුදායී සූත්‍රය) බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1964, පිටුව 378.
30. මජ්ඣිම නිකාය, (මහා තණ්හාසංඛය සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1962 පිටුව 246.
31. දීඝ නිකාය 1, (බ්‍රහ්මජාල සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1962, පිටු 1-80.
32. සංයුත්ත නිකාය 3, (නිරුත්තිපථ සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1983, පි.122.
33. සංයුත්ත නිකාය, (වජිරා සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1962 පිටුව 246.
34. සංයුත්ත නිකාය, (අචේලකස්සප සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1962. පිටුව 32.
35. සංයුත්ත නිකාය, (චේතනා සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1962. පිටුව 446.
36. සංයුත්ත නිකාය 3, (බීජ සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1983. පිටුව 97.
37. දීඝ නිකාය 2, (මහානිදාන සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 1983, පිටුව 80.
38. මජ්ඣිම නිකාය 1, (මධුපිණ්ඩික සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 1964, පිටුව 277.
39. දීඝ නිකාය 3, (චක්කවත්ති සීහ නාද සූත්‍රය), බු.ජ.ත්‍රි.ග.මා. 1976, පිටුව 116-120.
40. දීඝ නිකාය 3, (අග්ගඤ්ඤ සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 1962. පිටුව 136.
41. දීඝ නිකාය, (සක්කපඤ්හ සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 1962. පිටුව 417.
42. දීඝ නිකාය, (සක්කපඤ්හ සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 1962. පිටුව 435.
43. සුත්ත නිපාතය, (කලහ විවාද සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 1977. පිටුව 273.
44. මජ්ඣිම නිකාය 2, (අග්ගිවච්චගොත්ත සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 263.
45. සංයුත්ත නිකාය 2, (උපනිස සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 51.
46. සංයුත්ත නිකාය 2, (ආහාර සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 20
47. මජ්ඣිම නිකාය 1, (මධුපිණ්ඩික සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 277.
48. දීඝ නිකාය 2, (මහානිදාන සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 80.
49. දීඝ නිකාය 2., (මහානිදාන සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 1983, පිටුව 87.
50. සුත්ත නිපාතය, (ද්වතානුපස්සනා සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 229, 737 ගාථාව.
51. සංයුත්ත නිකාය 2., (නළකපාල සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 181.
52. මජ්ඣිම නිකාය 1, (මහාහත්ථිපදෝපම සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 461.
53. මජ්ඣිම නිකාය, 1, (මහාහත්ථිපදෝපම සූත්‍රය), බු.ජ.ත්‍රි.ග්‍ර.මා. 2006, පිටුව 460.